සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/පොදු
ඔබේ අංකය / உமது இல / Your No: ...........................
දිනය / திகதி / Date: 2020.06.29

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

<u>විශ්‍රාමික නිලධාරින් නැවත සේවයේ යෙදවීම</u>

මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කර වයස අවුරුදු 55 හෝ 60 සම්පූර්ණ කිරීම මත විශ්‍රාම ගන්වා ඇති නිලධාරින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා විශාල වශයෙන් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් පවතී.

02. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2019 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 හා 03/2019 යන චක්‍රලේඛ විධිවිධාන කෙරෙහි කාරුණික අවධානය යොමු කරනු කැමැත්තෙමි.

03. ඉහත චක්‍රලේඛවලින් අවධාරණය කර ඇති පරිදි විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවය සඳහා පත්කරනු ලබන්නේ අත්‍යාවශ්‍යයෙන්ම රාජකාරි අවශ්‍යතාවය මත පමණක් අතර, විශ්‍රාමික නිලධාරියෙකුගේ ඉල්ලීමක් මත පමණක් එවනු ලබන ඉල්ලුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ඇත.

04. ඒ අනුව, පුරප්පාඩු පිරවීමට නොහැකි හෝ වැඩ බැලීමට නිලධාරියකු පත් කිරීමට හෝ නොහැකි බවට අදාළ බලධාරියා විසින් පෞද්ගලිකව නිර්දේශ කරන අවස්ථාවක හැර විශ්‍රාමික නිලධාරියෙකු විසින් කරන ඉල්ලීමක් මත පමණක් එවැනි ඉල්ලීම් නිර්දේශ කර ඉදිරිපත් කිරීමෙන් වලකින ලෙස කාරුණිකව ඉල්ලමි.

05. එසේම පහත සඳහන් අවස්ථාවන්ට අදාළ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ඇත.

i. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර නිලධාරියකුගේ පෞද්ගලික ඉල්ලීම මත විශ්‍රාම ගන්වා ඇති විට.

ii. සේවා අකාර්යක්ෂමතාවය මත, වෛද්‍ය හේතූන් මත හෝ විනය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති විට.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

iii. අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමට අපොහොසත්වීම මත වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දිගු ලබා නොදීමේ කොන්දේසියට යටත් කර පත්වීම් ලබාදී ඇති නිලධාරින් වයස අවුරුදු 55 දී විශ්‍රාම ගන්වා ඇති විට.

iv. සේවා කාලය තුළදී යම් විෂමාචාරයක් සම්බන්ධයෙන් විනය දඬුවම් ලබා ඇති විට. (අවවාද කිරීම හෝ තදින් අවවාද කිරීම හැර)

06. ඊට අමතරව දැනට සමෘද්ධි කළමනාකරු සහ ඒ ආශ්‍රිත නිලධාරින් අතිරික්ත ලෙස හඳුනාගෙන ඇති මහනුවර, කෑගල්ල, කුරුණෑගල, ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා සමෘද්ධි කළමනාකරුවන් වෙනුවෙන් වන ඉල්ලීම් සළකා බලනු නොලැබේ. එහෙත් එවැනි නිලධාරියෙකු පුරප්පාඩු පවතින වෙනත් දිස්ත්‍රික්කයක සේවයේ යෙදවීම සඳහා අදාළ ආයතන ප්‍රධානියා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම් අවස්ථානුකූලව ඒ පිළිබඳව සළකා බලනු ලැබේ.

07. අදාළ සියළු ඉල්ලීම් මේ සමඟ අමුනා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් පෞද්ගලිකව සෑහීමට පත් වීමෙන් අනතුරුව තම නිර්දේශය ලබාදිය යුතුය.

08. රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු බැවින් ඉහත උපදෙස් තරයේ ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්,කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. රාජ්‍ය ලේකම්, සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ගැ.ස.